# ඇබෑර්තු

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**(සම්පූර්ණයෙන් රජය සතු සමාගමකි)**

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

සමාගමේ පවත්නා පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මුදල් (තනතුරු 01)
## ස්ථිර පදනම මත

1.1 **සුදුසුකම් :** බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

**බාහිර :** 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගණකාධිකරණය, මුදල් හෝ මූල්‍ය කළමනාකරණය (B. com) පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) හෝ තනතුරෙහි විෂය පථයට අදාළ වන පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**අභ්‍යන්තර :** 1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය පථයෙහි කළමනාකාර ප්‍රභේදයේ (MM) ශ්‍රේණිය I තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1.2 **වැටුප් පරිමාණය :**

HM 1-1-2016 රු. [80,295 - 15 x 2,270 - 114,345]

1.3 **වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**සෑම අයදුම්කරුවකුම :**

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට අදාළ රාජකාරි මැනවින් ඉටුකිරීම පිණිස හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම පිණිස ශාරීරික හා මානසික යෝග්‍යතාව සහිත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

**කරුණාවෙන් සළකන්න :**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) ඇබෑර්තුව ඇත්තේ කුරුණෑගල, දොඩම්ගස්ලන්ද, මාදුරාගොඩ මිනිරන් (ග්‍රැෆයිට්) පතල් කාර්යාලයේය.

මිනිරන් හා සබැඳි කර්මාන්ත හෝ නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ පළපුරුද්ද සහ පෞද්ගලික අංශයේ සමාන තත්ත්වයේ පළපුරුද්ද වාසිදායක ලෙස සළකනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ/ සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් වරප්‍රසාද :**

01. සේවකයා විසින් 10% ක හා සේව්‍යා විසින් 15% ක (සේවක භාරකාර අරමුදලට 3% ඇතුළුව) සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය, ජීවන වියදම් දීමනාව, ගමන් වියදම් දීමනාව සහ රාජ්‍ය චක්‍රලේඛ පරිදි අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම්, දිනපතා පැමිණීම මත පදනම්ව ආහාර දීමනාව, සේවක රක්ෂණ යෝජනා ක්‍රමය සහ නිෂ්පාදනය මත පදනම් වූ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයද ඊට අයත් වේ.

02. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

03. කරුණාකර ඔබේ අයදුම්පත සහතික පිටපත් සමග 2025.02.25 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට තැපැල් කරන්න. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ තනතුර සඳහන් කරන්න.

**සභාපති,**
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්,**
**561/3, ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ - 05.**